# AN ETHNOLOGICAL STUDY ON GOD VAHALA CONCEPT AND VAHALA DANCE IN DEVOLMADUWA SHANTHIKARMAYA

G.K. Subhash[1]

**Abstract**

Devolmaduwa Shanthikarya is a ritual ceremony that is performed in the law country areas of Sri Lanka. Wahala Devi or Dadimunda Devi is a locally popular deity who is worshiped around the country. The main purpose of this study is to identify the interrelationship between the God Wahala and Devolmaduwa Ritual Ceromony from an ethnographical perspective. Other objectives are to identify the specialty of Wahala Dance and to identify the concept of Wahala Deity. The research problem is how the Concept of Wahala Deity is related to the Law Country Devolmaduwa Ritual Ceremony. Field observations, interviews were used as the primary source, books and internet sources were used as the secondary source. As revealed by this research, the concept of God Wahala has been known in the community as an extremely powerful deity. There is a recognition of this deity as a deity as well as lord of demons. The elements of Wahala dance have been created to highlight the concept of God Wahala. There is a strong belief that the artiste who performs the Wahala dance, dances in the attribution of Lord Dadimunda. The entire dance symbolically represents the power of Lord Wahala. Thus, it can be concluded that there is a special relationship between Wahala dance in Dewolmaduwa and the concept of God Wahala. Accordingly, Wahala dance and the concept of God Wahala can be seen as important cultural concepts in Sri Lankan culture.

**Keywords**: Devol Maduwa, Ritual Ceremony, Sri Lankan Culture, Wahala Dance

[1] Postgraduate Student, Department of Music and Creative Music Technology, University of Sri Jayewardenepura

Email: subashkavidhu1@gmail.com https://orcid.org/0009-0009-0304-6016

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුද ලබන වාහල දෙවි සහ වාහල නර්තනය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්


## සාරසංක්ෂේපය

දෙවොල් මඩුව ශාන්තිකර්මය ලංකාවේ පහතරට ප්‍රදේශයන්හි ව්‍යාප්තව පවතින ශාන්තිකර්මයකි. වාහල දෙවි හෙවත් දැඩිමුණ්ඩ දෙවි ලංකාවේ බොහෝ ප්‍රදේශවල පූජාවට ලක්වන දේව සංකල්පයකි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ දෙවොල් මඩුව ශාන්තිකර්මය හා වාහල දේව සංකලපය අතර පවත්නා අන්තර සබඳතාව මානවවංශලේඛීයමය දෘෂ්ටිකෝණයකින් විග්‍රහ කිරීමය. අනෙකුත් අරමුණු වන්නේ වාහල නර්තනයේ සහ වාහල දේව සංකල්පයේ පවත්නා සුවිශේෂතාව හඳුනාගැනීමය. මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂණ ගැටලුව වන්නේ වාහල නර්තනය පහතරට දෙවොල්මඩුව ශාන්තිකර්මයට සම්බන්ධ වන්නේ කෙසේද? යන්නය. ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන්ද ග්‍රන්ථ හා අන්තර්ජාල ලේඛන ද්වීතීයික මූලාශ්‍රය වශයෙන්ද භාවිත කෙරිණි. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ ආකාරයට ප්‍රබල දේව සංකල්පයක් ලෙස වාහල දේව සංකල්පය ජන සමාජය අතර මුල්බැසගෙන තිබේ. එසේම වාහල දෙවි දේව ස්වරූපයෙන් මෙන්ම යක්ෂාධිපතියෙකු වශයෙන්ද පිළිගැනීමක් පවතී. ඒ අනුව දැඩිමුණ්ඩ හෙවත් වාහල දේව සංකල්පය උත්කර්ෂයට නැගීම සඳහා වාහල නර්තනය උපයෝගී කරගනු ලැබේ. වාහල නර්තනය සිදු කරනු ලබන්නේ දැඩිමුණ්ඩ දේවාරූඪයෙන් බවට ජනතා විශ්වාසයක් පවතී. සමස්ත වාහල නර්තනයෙන් වාහල දෙවියන් සතු බලය සංකේතාත්මකව නිරූපණය කරනු ලැබේ. ඒ අනුව දෙවොල් මඩුවේ රඟ දැක්වෙන වාහල නර්තනය සහ වාහල දේව සංකල්පය සමඟ අත්‍යන්ත සබඳතාවක් පවතී. යථෝක්ත කරුණු අනුව වාහල දේව සංකල්පය හා වාහල නර්තනය ජන සමාජයේ ව්‍යාප්තව ඇති වැදගත් සංස්කෘතික සංකල්ප ද්විත්ත්වයක් බවට නිගමනය කළ හැකිය.


**ප්‍රමුඛ පදඃ** දෙවොල් මඩුව ශාන්තිකර්මය, පහතරට ශාන්තිකර්ම, වාහල නර්තනය, ශ්‍රී ලාංකේය සංස්කෘතිය

## හැඳින්වීම

සංස්කෘතික මානව විද්‍යා (Cultural Anthropology) අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ දේව සංකල්ප හා ශාන්තිකර්ම පිළිබඳ අධ්‍යයනය කිරීම් සඳහා ඇත්තේ පුළුල් අවකාශයකි. දෙවොල් මඩු ශාන්ති කර්මය යහපත හා සශ්‍රීකත්වය අරමුණු කරගෙන පවත්වනු ලබන ලංකාවේ පහතරට ප්‍රදේශයන්හි ව්‍යාප්තව පවත්නා ශාන්ති කර්මයක් වන අතර දැඩිමුණ්ඩ දෙවි දෙවොල් මඩු ශාන්ති කර්මයේ පුද ලබන ප්‍රමුඛ දෙවියෙකි. ඒ අනුව ලංකාවේ දේශීය වශයෙන් පුදපූජාව ට ලක්වන ජනප්‍රිය දේවතා සංකල්පයක් ලෙස දැඩිමුණ්ඩ දෙවි සංකල්පය හඳුන්වාදිය හැකිය. එම දෙවියන්ට පර්යාය වශයෙන් 'වාහල දෙවි' යන නාමයද ව්‍යවහාර කැරේ. (ධර්මදාස, 2017) මානව විද්‍යා හා සංස්කෘතික අධ්‍යයන ක්ෂේත්‍රයට අයත් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස හඳුනාගැනෙන මානවවංශ විස්තරකථන අධ්‍යයන (Ethnographic Studies) විවිධ සංස්කෘතීන්ට අයත් තොරතුරු සොයායාමත්, එම සංස්කෘතීන්ට අයත් සංස්කෘතිකාංග පිළිබඳ සවිස්තර වාර්තා සැපයීමත් සම්බන්ධ අධ්‍යයන ක්ෂේත්‍රයකි. එසේම මානවවංශ අධ්‍යයන සංස්කෘතිය සහ මිනිසා අතර පවත්නා අවියෝජනීය සබඳතාව මතු කරයි. (ආනන්ද, 2019) ඒ අනුව සශ්‍රීකත්වය අරමුණු කරගෙන ඉදිරිපත් කෙරෙන ගම්මඩු හෙවත් දෙවොල් මඩු ශාන්තිකර්මයේ නර්තනාංගයන්ට වාහල දේව සංකල්පය බලපෑ ආකාරය මානවවංශ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිතය.

මෙම අධ්‍යයනයට අදාළව "දෙවොල් මඩු ශාන්තිකර්මයට වාහල දේව සංකල්පය සම්බන්ධ වන්නේ කෙසේද?"යන්න අධ්‍යයන ගැටලුව ලෙස හඳුනාගන්නා ලදි. ගම්මඩු ශාන්තිකර්මයට වාහල හෙවත් දැඩිමුණ්ඩ දේව සංකල්පය බලපා ඇති ආකාරය හඳුනාගැනීම මෙම අධ්‍යයනයට අදාළ ප්‍රධාන අරමුණ වෙයි. සෙසු අරමුණු වන්නේ දැඩිමුණ්ඩ දේව සංකල්පය හඳුනාගැනීම හා වාහල නර්තනයේ මානවවංශ විද්‍යාත්මක විශේෂතාව හඳුනාගැනීමයි.

**සාහිත්‍ය විමර්ශනය**

වාහල නර්තනය හා වාහල දේව වන්දනාව අතර ඇති සබඳතාව පිළිබඳ කැරුණු ඍජු පර්යේෂණ සාහිත්‍යයක් හඳුනාගැනීම උගහට ය. එසේ වුවත් දෙවොල්මඩු ශාන්තිකර්මය, වාහල දේව ඇදහීම ආදී තේමා මුල්කරගෙන සිදු කරන ලද සමාජ විද්‍යාත්මක හා සංස්කෘතික විවරණාත්මක අධ්‍යයන පවතී කාරියවසම් (1990, 1991). වාහල නර්තනය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු ඉදිරිපත් කරන නමුත් එය වාහල දෙවි හා දෙවොල් මඩුව අතර පවත්නා අන්තර් සබඳතාව විග්‍රහ කිරීමේ අරමුණෙන් ඉදිරිපත් කරන ලද්දක් නොවේ. එසේම ඔහු සිය ශාන්තිකර්ම හා සිංහල සමාජය කෘතියේ දක්වන දේව කන්නලව්වේ එන දැඩිමුණ්ඩ දෙවි සම්බන්ධ විස්තරය දැඩිමුණ්ඩ දෙවි පිළිබඳ පවත්නා සාම්ප්‍රදායික අදහස් හඳුනාගැනීමට වැදගත් වෙයි. ඔබේසේකර (1984) වාහල නර්තනය පිළිබඳ නිරීක්ෂණ දක්වන අතර එයින් ශක්තිය හා වීර්යය ප්‍රකට වන බව දක්වයි. ඕවිටගෙදර (2001) දැඩිමුණ්ඩ දේව සංකල්පය හා ඒ ආශ්‍රිත වත් පිළිවෙත් ඉදිරිපත් කරන නමුත් ප්‍රස්තුත වාහල දෙවි දෙවොල් මඩුව අතර ඇති සබඳතාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේ නැත. මීට අමතර ව ධර්මදාස හා තුන්දෙණිය (2017), ප්‍රනාන්දු (1910), සිල්වා (1994), සරච්චන්ද්‍ර (2012), අනෝමදස්සී හිමි (1965) හා කාරියවසම් (1990) යන අය විසින් ගම්මඩු ශාන්තිකර්මය, වාහල දේව ඇදහිල්ල යනාදිය පිළිබඳ විග්‍රහ කරනු ලබන නමුත් ඒවා ප්‍රස්තුත මාතෘකාව අරමුණු කර ගන්නා ලද විග්‍රහයන් නොවන බව හඳුනාගත හැකිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මේ අධ්‍යයනය ගුණාත්මක ප්‍රවේශය යටතේ සිදු කරන ලදි. සාහිත්‍ය ගවේෂණයෙන් අනාවරණය වූ පරිදි ගම්මඩු ශාන්තිකර්මය පිළිබඳ විවිධ අධ්‍යයන සිදු කර ඇති නමුත් එහි ඇති විශේෂ නර්තනාංගයක් වන වාහල නර්තනය පිළිබඳ ප්‍රාමාණික හැදෑරීම් කෙරී ඇත්තේ අල්ප වශයෙනි. එයිනුදු වාහල දේවතා සංකල්පය හා දෙවොල් මඩුව ශාන්තිකර්මය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනයක් මෙතෙක් සිදු කෙරී නොමැත. වාහල දෙවි පිළිබඳ දත්ත අධ්‍යයනය සඳහා මූලික වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රයද අවශේෂ වශයෙන් සම්මුඛ සාකච්ඡා මූලාශ්‍රයද පරිශීලනය කෙරිණි. දෙවොල් මඩුවේ එන වාහල නර්තනය අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් 2017 හා 2018 යන වසරවලදී හේවාගම් කෝරළයේ කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පවත්වන ලද දෙවොල් මඩු ශාන්තිකර්මද, 2023 වසරේදී දෙල්ගොඩ අහුගම්මන ග්‍රාමයේ සිදු කෙරුණු දෙවොල් මඩු ශාන්තිකර්මයද ඇසුරුකරගෙන වාහල නර්තනාංගය පිළිබඳ අධ්‍යයනය කරන ලදි. අධ්‍යයන මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා හා ක්ෂේත්‍ර අධ්‍යයන හා සහභාගීත්ව නිරීක්ෂණ ප්‍රාථමික දත්ත එක් රැස් කිරීමේ මූලාශ්‍රය ක්‍රම ලෙස ද ද්වීතීයික මූලාශ්‍රය ක්‍රම ලෙස ග්‍රන්ථ මූලාශ්‍රය හා අන්තර්ජාලයද භාවිත කරන ලදි.

**සාකච්ඡාව**

**දෙවොල් මඩු ශාන්තිකර්මයඃ කෙටි හැඳින්වීමක්**

දෙවොල් මඩු ශාන්තිකර්මය ලංකාවේ පහතරට ප්‍රදේශයන්හිදී පවත්වනු ලැබේ. පත්තිනි දේවතාවිය, දෙවොල් දේවතාවා, වාහල හෙවත් දැඩිමුණ්ඩ දේවතාවා සහ තවත් දෙවිවරුන් මුල්කරගෙන මෙම ශාන්ති කර්මය සිදු කරනු ලැබේ. දින කිහිපයක් පුරා සිදු කරනු ලබන මෙම ශාන්ති කර්මය තොටඹෙට යාම, ඔරුමාල පිදේනිය දීම, හගල පේ කිරීම, තෙල් වැඩම වීම, රාත්‍රී පහන් දැල්වීම, මල් යහන් දැල්වීම, යහන් පිරීම, කාල පන්දම් යාගය, පන්දම් නැටීම

නොහොත් පන්දම් පාලිය, හැන්දෑ සමයම නැටීම, බිසෝ කප සිටුවීම, තොරන් යාගය, පත්තිනි නැටීම, හළඹ පාවා දීම නොහොත් හළං පේ කිරීම, මඟුල් බෙර වාදනය, තෙල්මේ නැටීම, මැදියම් සන්නි පිදේනි පුද කිරීම, දේව මුරුතැන් පිදීම, වාහල නැටුම යන අංග අවසානයේ ගරා යක් නැටීමෙන් හා දේව දානයකින් නිමා වෙයි. අතීතයේ මංගර උපත, මරා ඉපැද්දීම, අඹ වියමන ආදී නාට්‍යමය ජවනිකා රඟ දැක්වූවද වර්තමානයේ ඒවා පැවැත්වීම අභාවයට යමින් පවතී. මල් හත් පදය නැටීම, තෙල්මේ නැටීම, පත්තිනි නැටීම, මඟුල් බෙර හා වාහල නැටීම යන නර්තන අංග දෙවොල් මඩුවේ අනිවාර්යෙන්ම රඟ දක්වනු ලබන නර්තන අංග වෙයි. සාමාන්‍යයෙන් පත්තිනි දේවිය මුල්කරගෙන සිදු වන ශාන්තිකර්මයක් බැවින් දෙවොල් මඩුව පවත්වනු ලබන දේවාලයේ මහ කපු මහතා පත්තිනි රාළ යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබයි. වර්තමානයේ ඇතැම් දෙවොල් මඩු වල ගිණි පෑගීමේ චාරිත්‍රයක්ද ඉටු කරනු ලබයි. පහතරට සම්ප්‍රදායයේ ප්‍රධාන දේව ශාන්තිකර්මයක් වන මෙම ගම්මඩු ශාන්තිකර්මයේ රඟ දැක්වෙන වාහල නර්තනය එක් සුවිශේෂී නර්තනාංගයක් ලෙස හඳුනාගත හැකිය.

**වාසල දෙවි හෙවත් දැඩිමුණ්ඩ දෙවියෝ**

දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් දෙපළ වන පත්තිනි දේවතාවිය හා දෙවොල් දෙවියන්ට අමතරව සමන් දෙවියන්, කතරගම දෙවියන් හා සතර වරම් දෙවිවරු ආදී දෙවිවරු පූජාවට ලක් වෙති. මොවුනතුරෙන් පූජාවට ලක්වන විශේෂ දේවතාවෙකු ලෙස දැඩිමුණ්ඩ දෙවියන් හඳුන්වා දිය හැකි වේ. දැඩිමුණ්ඩ දෙවියන් එක් ගමකට හෝ ප්‍රදේශයකට හෝ පළාතකට පමණක් සීමා වූ දෙවියෙකු නොවන බව උගතුන්ගේ මතයයි. මෙම දෙවි උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායයන් තුනෙහිම විශේෂ කාර්යයන් හා සම්බන්ධ වී සිටීමෙන් එම කාරණය සනාථ වේ. විශේෂයෙන් අමනුෂ්‍ය පිරිස් අවනත කරගැනීමේ ක්‍රියාවලිය සඳහා සෘජුවම සම්බන්ධ වන දේවතාවෙකු වශයෙන් මෙම දෙවි හඳුන්වා දිය හැකිය (ඕවිටගෙදර, 2001). දැඩිමුණ්ඩ දේව සංකල්පය විවිධ ප්‍රදේශයන්හි ප්‍රාදේශීයව අවශේෂ වශයෙන්ද, ප්‍රමුඛ වශයෙන්ද පූජාවට පාත්‍ර වේ. දැඩිමුණ්ඩ දෙවියන් කෑගල්ල ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ඇදහීමට ලක් වන දෙවියෙකු ලෙස හඳුනා ගත හැකි අතර ප්‍රධාන දැඩිමුණ්ඩ දේවාලය මාවනැල්ල ප්‍රදේශයේ පිහිටා ඇත. සතර කෝරළයේ අලුත් නුවර ප්‍රදේශය දැඩිමුණ්ඩ දෙවියන් සම්බන්ධයෙන් චිර ප්‍රසිද්ධියක් උසුලන අතර එහි පිහිටා තිබෙන ගල කැප්පූ දේවාලය, ගිරුවා අම්බලම, දැඩිමුණ්ඩ දේවාලය යන ස්ථාන දැඩිමුණ්ඩ දෙවි උදෙසා නිර්මාණය වූ ඓතිහාසික සිද්ධස්ථාන අතුරින් ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගනී. පැස්කුවල් (2016)ට අනුව වාහල දෙවි බස්නාහිර මෙන්ම සතර කෝරළේ ප්‍රධානව ඇති සබරගමුවේද ප්‍රචලිත දෙවි කෙනෙකි. ඒ අනුව දැඩිමුණ්ඩ දෙවි බොහෝ ප්‍රදේශ වල වන්දනාවට ලක්වන දෙවියෙකු ලෙස හඳුනාගත හැකි වේ (චාමර සහ තවත් අය, 2017).

සාමාන්‍ය භාවිතය අනුව 'දැඩි' යනු තද යන්නයි. 'මුණ්ඩ' යනු හිතයි. එනයින් තද/ දැඩි හිතක් ඇති තැනැත්තා යන අර්ථයෙන් දැඩිමුණ්ඩ නාමාර්ථය දැක්විය හැකිය. දැඩි යන්න 'මුරණ්ඩු' යන අරුතත් 'මුණ්ඩ' යනු මුඩු කළ යන අදහසත් ගෙන දෙන බව මංගල කීර්ති (2008) ගේ අදහසයි. ඕවිටගෙදර (2001)ට අනුව 'දැඩිමුණ්ඩ' යන්නෙන් නිර්භීත ශක්තිමත් පුරුෂයා යන අර්ථය ගෙන දේ. දැඩිමුණ්ඩ දෙවියන් පිළිබඳ ඓතිහාසික සාක්ෂ්‍ය දරන සාහිත්‍ය මූලාශ්‍රය අතර ගලකැප්පූ හටන, ගල කැප්පු සැහැල්ල, ශ්‍රී විෂ්ණු අෂ්ටක, දැඩිමුණ්ඩ අෂ්ටක මාලා, දේවාරාධනා, මල්යහන් කවි හා යාදිනි ආදි පැරණි කෘති සුවිශේෂත්වයක් උසුලන නමුදු වර්තමානයේ එම මූලාශ්‍රය බොහොමයක් අභාවයට ගොස් ඇත. (අනෝමදස්සී හිමි, 1965) පුරාතන යුගයේ පටන් විවාහ මංගලෝත්සව වලදී දැඩිමුණ්ඩ අෂ්ටක ගැයීමද සිරිතකි (අනෝමදස්සී හිමි, 1965).

***දැඩිමුණ්ඩ දෙවියන්ගේ උපත***

දැඩිමුණ්ඩ දෙවියන්ගේ උපත පිළිබඳ ප්‍රවාද භාවිතයේ එතරම් ප්‍රචලිත ව නොපවතී. එහෙත් දැඩිමුණ්ඩ දෙවි උපත පිළිබඳ ජාතක පොතේ විධුර ජාතකයට සම්බන්ධ කොට නිර්මිත ප්‍රවාදයක් පවතී.

*"දීර බලැති ලොව පරසිඳු යකු හට*
*කාර බැඳපු එබිසෝ ළඳ සරණය සිහි කොට*
*වාර ගණන් කල් පසු වුණිද බිස වට*
*නැර එ පූර්ණක යකු හට දා කොට"*

*"වරන් ඇතුව ලක්දිව පන් දහසට*
*නරන් රකින ලොව සාසන මතු පන් දහසට*
*සුරන් ඉසුරු සැම දෙවියන් රැස් කොට*
*ඉරන්දතී බිසවගෙ කුස පිළිසිඳ එම විට "*

*"වැස මවු ගැබ සැපසේ වැඩ උන්නා*
*දස මස පසුවුණි බිසවට ලකුණු පෙ නෙන්නා*
*රැක මිණි කලඹක් සේ දිලි සෙන්නා*
*දස වියතුනි දැඩි මුඩ සුර කුමරු උ පන්නා "* (ඕවිටගෙදර, 2001, පි.72-73)

මේ අනුව දැඩිමුණ්ඩ පූර්ණක යක් සෙනෙවියාට දාව එරන්දතී නාග කන්‍යාවගේ කුසින් උපන් අයෙකු බවට ජනශ්‍රැති හෙළි කරයි. විශේෂයෙන් එරන්දතී පුත්‍ර, පූර්ණක යක් පුත්‍ර යනුවෙන් යොදන පර්යාය නාමයන්ගෙන් ඒ බැව් ස්ඵුට වෙයි. එම ප්‍රවෘත්තිය සනාථ කරමින් දැඩිමුණ්ඩ දෙවියන්ගේ උපත දැඩිමුණ්ඩ මල්යහන් කවි නැමැති පුරාණ ග්‍රන්ථයේ සඳහන් වන්නේ මේ ආකාරයටය.

*"පුන්නක යක් සෙනෙවි රදුට දාව සොඳින්නේ*
*එරන්දතී නා කතගේ කුසින් උපන්නේ*
*වරන් ලබා සුරරද වෙසසුණු දෙ විඳුන්නේ*
*මෙ ලංකාවෙ යකුන් සැවොම වෙව් ලා ඉන්නේ "* (අනෝමදස්සී හිමි, 1965, පි.8).

එරන්දතී යනු විධුර ජාතකයේ එන වරුණ නා රජුගේ හා විමලා දේවියගේ දියණියයි. පූර්ණක යක් සෙනෙවිට දාව ඇගේ කුසෙන් උපන් බැවින්ද, වරුණ නා රජුගේ හා විමලාවන් ගේ මුණුපුරු වූ බැවින්ද ඔහු සුදුමල් කුමාරයා ලෙසද හඳුන්වන බවද පැවසේ. වැඩිවියට පත්වීමෙන් පසු මෙම සුදුමල් කුමාරයා දෙව් පුරයට ගොස් නාරායණ දෙවියන්ටත්, කදිරාපුර දෙවියන්ටත්, සමන් දෙවියන්ටත් අභිවාදන පූර්වක භක්ති ගායනා කළ බවද ඒ අසා පැහැදුණු දෙවිවරු ලක් බුදු සසුන රැක බලා ගැනීම සුදුමල්ට පැවරූ බවද පුරාණෝක්තියෙහි එයි. (සිල්වා, 1994) තවත් ජනශ්‍රැතියකට අනුව ඔහු උපුල්වන් මහ රජුගේ හා සඳවතී දේවියගේ පුත්‍රයාය (ලංකාතිලක, 2002).

ඇතැම් තැනක දැඩිමුණ්ඩ දෙවි දේශීයව ප්‍රභවය ලද දෙවි කෙනෙකු වශයෙන් සඳහන් වෙතත් සිල්වා (1964)ට අනුව දැඩිමුණ්ඩ දෙවි භාරතයේ සිට මෙරටට සංක්‍රමණය වූ දෙවි කෙනෙකි. ඔහු සඳහන් කරන ආකාරයට ලක්දිව පස්වාදහසක් කල් බුදු සසුන සුරැකීම සඳහා මෙරටට වැඩි බවට දැඩිමුණ්ඩ අවතාරය නම් කවි පොතෙහි සඳහන් වන අතර දැඩිමුණ්ඩ වරුණ නම් කවි පොතෙන් හෙළිවන පරිදි බුදුන්වහන්සේගේද, නාරායන, ස්කන්ධ, සහ ශක යන දෙවිවරුන්ගේද රැකවරණය යටතේ ලංකාවට පැමිණෙන අතරමගදී නැව බිඳී දෙවිනුවරට ගොඩ බැස, ඉනික්බිත් සීනිගමටත්, උග්ගල්නුවරටත්, දඹදෙණි නුවරටත් අනුපිළිවෙළින් පැමිණි බව කියැවේ.

කාරියවසම් (1976) දක්වන දේව කන්නලව්වෙන් ඉදිරිපත් වන ආකාරයට දැඩිමුණ්ඩ දෙවි ජම්බුද්වීපය, උතුරුකුරු දිවයින, පූර්ව විදේහය, කාලිංගය ආදී නොයෙක් රටවල යක්ෂ සේනාවත් සමග සංචාරය කොට පසුව ලක්දිව අලුත්නුවරට දේවාලයට අධිගෘහිත වූ අයෙකි:

> ...........තවද අලුත් නුවර දේවාලයට අධිගෘහිත වන්නාවූ දැඩිමුණ්ඩ වාහල බණ්ඩාර දේව ස්වාමීන් වහන්සේ උතුරුකුරු දිවයින, අපරගෝධානය, පූර්ව විදේහය, ජම්බුද්වීපය, කළිඟු රටය, කාසි රටය, සොළීරටය, පටුනු රටය, නාග රටය, අරමන දේශය, දොලුවර දේශය, මල්ලව දේශය, කාම්බෝජ රටය, වඞ්ග දේශය ය යන මෙකී දේස වල ඇවිද ගෙන යක්ෂ සේනාව පිරිවරා ගෙන ගල කැප්පු දේවාලයට ගොඩ බැස අත තිබූ රන් ඊය සිටුවා ඒ මාලිගාවේ වැඩ සිට ගෙන රුහුණු මායා පිහිටි යන ත්‍රිසිංහලද්වීපයෙහි කෙලි අනුග්‍රහ පවත්වන්නාවූ දැඩිමුණ්ඩ වාහල බණ්ඩාර දේව ස්වාමීන් වහන්සේගේ...........(පි. 153)

එසේම දැඩිමුණ්ඩ කවි නම් පොතේ සඳහන් ආකාරයට දැඩිමුණ්ඩ ලංකාවට පැමිණියේ විෂ්ණු දෙවියන්ගේ රැකවරණයෙනි. (සිල්වා, 1964) ඒ අනුව දැඩිමුණ්ඩ දේව සංකල්පය දේශීයව ප්‍රභවය ලද්දක් බවට සිතීමට වඩා විදේශයක ප්‍රභවය වී දේශීය වශයෙන් ව්‍යාප්ත වූ දේව සංකල්පයක් ලෙස ගැනීම වඩා සාධාරණ බව පෙනී යයි.

### *දැඩිමුණ්ඩ දෙවිගේ අන්වර්ථ නාම*

මෙම දෙවියන් හඳුන්වනු ලබන අන්වර්ථ නාම රැසකි. සෙනෙවිරත්න අධිකාරම්, අලුත් නුවර දේවතා බණ්ඩාර, සඳුන් කුමාර, මැණික් බණ්ඩාර, කීර්ති බණ්ඩාර, ඌවේ බණ්ඩාර යනාදිය කීපයකි. දැඩිමුණ්ඩ දෙවියන්ට පර්යාය නම් 44 ක් ඇති බව ඇතැමුන්ගේ මතයයි (ලංකාතිලක , 2002).

බණ්ඩාරට (2005) අනුව දැඩිමුණ්ඩ දෙවියන්ට පර්යාය ලෙස භාවිත කරන නාම රාශියකි. ඔහු සඳහන් කරන ආකාරයට මෙම පර්යාය නාම බහුත්වයට මව්පිය ආර, රූප ලක්ෂණ, නෑ සබඳකම්, වීර පරාක්‍රමය, භාෂාමය විවිධතා, ඓතිහාසික සිද්ධීන් හා වරුග බෙදීම් ආදි විවිධ කාරණා හේතු වී ඇත:

> දැඩිමුණ්ඩ, දැඩිමුඩ දෙවි, දැඩිමුණ්ඩ, බණ්ඩාර දෙවි, දැඩිමුණ්ඩ වාහල දෙවි, දැඩිමුණ්ඩ වාහල දෙවි, දැඩිමුණ්ඩ යක් දෙවි, දැඩිමුණ්ඩ යකා, දැඩිමුණ්ඩ සෙනෙවිරත්න දෙවි, දැඩිමුණ්ඩ සෙනෙවිරත්න බණ්ඩාර දෙවි, කන්දේ දෙවි, කන්දේ බණ්ඩාර දෙවි, කන්දේ යක් දෙයියා, කන්දේ යකා, වාහලයා ,පූර්ණක යක් පුත්‍ර, පූර්ණක සුත, යක් සෙනෙවි ,සෙනෙවිරත්න අධිකාරම් දෙවි, කීර්තීශ්වර බණ්ඩාර දෙවි, වාහල බණ්ඩාර දෙවි, දෙවි සෙනෙවි, කුක්කුඨ ඡත්‍ර ධර, විසිදාගම ගලේ දෙවි, වෙසමුණි මුනුබුරු, කීර්ති බණ්ඩාර, දැඩිමුණ්ඩ සෙනෙවිරත්න අධිකාරම, දේව සෙනරත් බණ්ඩාර, ගලේ බණ්ඩාර, ගඟේ තැන්නේ බණ්ඩාර, ගනේ තැන්නේ ගලේ බණ්ඩාර, බණ්ඩාර දේවේන්ද්‍ර මන්ත්‍ර පති, තන්ත්‍ර පති, යක් පති, අසුර යක් පති, ගරුඬාධිපති, සිරි දෙවි, එරන්දතී පුත්‍ර, විසිදාගම ගලේ බණ්ඩාර, හඳුන් කුමාර (පි.176-177) .

ඇතැම් පාරම්පරික ඇදුරෙකුට අනුව දේවතා බණ්ඩාර ලෙස හැඳින්වෙන්නේ දැඩිමුණ්ඩ දෙවියන්ය (රණසිංහ, 2019.03.20). දැඩිමුණ්ඩ දෙවි එනම් වාහල දෙවි හා දෙවොල් දෙවි යනු එක් අයෙක් බවට තමා සැක කරන බවට සරච්චන්ද්‍ර (1966) පවසන අතර එය සනාථ කිරීමේ සාධක දෙවොල් නාමේ යන කෘතියේ එන 'වාහල දෙවොල් නාමේ, වාහල දෙවොල් යාගේ' යන යෙදුම් තුළින් හැඟවෙන බව පෙන්වා දෙයි. එසේ වුවත් මෙම දෙවිවරුන් දෙදෙනාම දෙවොල් මඩුවේ වෙන වෙනම පූජාවට ලක් වන නිසා මෙම මතය පිළිගැනීම අභියෝගාත්මකය. දෙවොල මඩු ශාන්ති කර්මයේ මෙම දෙවිවරුන් දෙදෙනාම පූජාවට ලක්වන්නේ අළුයම් කාලයට ආසන්නයේදීය. ගම්මඩු දෙවොල් මඩු ආදියෙහි දෙවොල් භාගය,

පත්තිනි භාගය හා වාහල භාගය වශයෙන් තෙකොටසකින් යුක්තව නටනු ලැබේ. ඒ අනුව බහුතර මතය අනුව මෙම දෙවිවරුන් දෙදෙනා දෙදෙනෙක් ලෙස හඳුන්වා දීම සුදුසුය.

දැඩිමුණ්ඩ හෙවත් වාහල දෙවි සඳහා යෙදෙන මේ නාමයන් විමසීමෙන් විශේෂයෙන් පිරික්සීමෙන් දැඩිමුණ්ඩ දෙවියන් පිළිබඳ පොදු මත කීපයක් හඳුනාගත හැකිය.

1. දැඩිමුණ්ඩ දෙවි මනුෂ්‍යත්වයේ සිට දේවත්වයට පත් වූවෙකු ය.
2. යක්ෂ නමින් හැඳින්වෙන කොට්ඨාසයක් සමඟ සමීප සම්බන්ධයක් පවතී.
3. දේවත්වයට පත් වීමට ප්‍රථම රජ වාසල ඉහළ නිලයක් දරා ඇති ජන ප්‍රධානියෙකි.
4. අලුත් නුවර, ඌව, විසිදාගම, ගගේ තැන්න, ඇම්බැක්ක ආදී ප්‍රදේශයන්ට සම්බන්ධතාවක් ඇත.

මේ අනුව දැඩිමුණ්ඩ විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලබන, විවිධ ප්‍රදේශයන්හි ජනප්‍රිය, සුවිශේෂී දේවතාවෙකු බව පැහැදිලිය.

***වාහල නිලය හෙවත් වාහල ධූරය***

ජනශ්‍රැති සහ සාහිත්‍යගත මූලාශ්‍රය අනුව වාහල යන්න දේව මණ්ඩලයට අදාළ කිසියම් ධූරයක් පිළිබඳ අදහසක් ගෙන දෙන බව හඳුනාගත හැකිය. බණ්ඩාරට (2005) අනුව ගම්මඩු, දෙවොල් මඩු, පූනා මඩු වලදී වාහල හත්කට්ටුවක් හෙවත් වාහල සත් දෙනෙකුන් විශේෂයෙන් ගෞරවයට පාත්‍ර වේ. අලුත් නුවර දැඩිමුණ්ඩ දෙවියන්ට අමතරව ශ්‍රී විෂ්ණු, ගම්බාර සිද්ධ සූනියම්, දෙවොල් ආදී දෙවිවරුන්ටද වාහල හත්කට්ටු වශයෙන් සේවය සපයන බව යකැදුරන්ගේ පිළිගැනීමයි. කතරගම දේවයාගේ රන් තොරණේ ආරක්ෂකයා ලෙස කඩවර දෙවි නම් කැරෙණ අතර දැඩිමුණ්ඩට දෙපසින් ගිණිකඩවර දෙවි දෙදෙනෙකු නිතරම වඩින බව සඳහන් වේ. පෙර තැනෙක දී කී පරිදි විෂ්ණු දෙවි දෙවිනුවරින් අලුත් නුවරට වැඩි අවස්ථාවේ දැඩිමුණ්ඩ විෂ්ණුගේ වාහල වූ බවත් පත්තිනියගේ වාහල ධූරය දෙවොල් දෙවි විසින් දරන බවත් තවත් මතයක එයි. ඉලංදාරි, කඩවර, කම්බිලි දෙවිවරු අයියනායක දෙවියන්ගේ වාහල ධූරය හොබවන අතර මල්වත්තේ බණ්ඩාර දැඩිමුණ්ඩ දෙවිගේ වාහල ධූරය දරයි. මේ අනුව වාහල යන යෙදීම පුද්ගල නාමයකට වඩා රාජකාරි නිලයක් හැඳින්වීමට යොදන ලද නාමයක් බව පැහැදිලි වේ. එසේම එය දැඩිමුණ්ඩ විෂයෙහිද විශේෂණයක් ලෙස බහුලව යොදා ගෙන ඇති බව පෙනේ. (බණ්ඩාර, 2005) දෙවි නුවරින් අලුත් නුවරට ශ්‍රී විෂ්ණු දෙවි පැමිණි විට අලුත් අලුත් නුවරට අධිපති අලුත් නුවර දේවතා බණ්ඩාර දෙවි ශ්‍රී විෂ්ණු දෙවිගේ වාසල දෙවි බවට පත් වූ බවත් ගම්මඩු තේවාවේදී පත්තිනි දෙවිඳුගේ වාහල බවට දෙවොල් දෙවි පත් වන බවටත් මතවාදයක් පවතින අතර බණ්ඩාරට (2005) අනුව වාහල දෙවි යනු මහ දෙවියන්ගේ දේව විමානය හෙවත් වාසලේ ආරක්ෂක දෙවියන්ය.

සතර කෝරළේ යක් දෙස්සන් විසින් සබරගමු වාහල දේව කට්ටුව හඳුන්වා දෙන්නේ මෙසේය.

"ඇවොල් වාහල, කාම වාහල, ලෝදැල් වාහල, අෂ්ට කාම වාහල, ගිනිජල් වාහල, පංච කාම වාහල, හඳුන් වාහල" (බණ්ඩාර, 2005, පි.125).

දෙවොල් මඩු නටනු ලබන ඇතැම් ගුරුකුලයක මතය අනුව වාහල කට්ටුවට නව වාහලක් අයත් වේ.

"ඇවොල් වාහල, අඳුන් වාහල, දෙවොල් වාහල, සඳුන් වාහල, ලෝ දැල් වාහල, පංච කාම වාහල, ගිනිජල් වාහල, අෂ්ට කාම වාහල, කාම වාහල" (බණ්ඩාර, 2005, පි.125). මෙම යෙදීම් අනුවද වාහල යන පදය ආරක්ෂක සේවාව සපයන දෙවිවරුන් වෙත පොදුවේ ව්‍යවහාර කරන ලද්දක් බව ප්‍රකට වේ.

***දැඩිමුණ්ඩ දෙවියන් හා බැඳි පුරාණෝක්ති***

ජනප්‍රවාදයට අනුව බුදු රදුන් මාර යුද්ධයට මුහුණ දෙන අවස්ථාවේ සියලුම දෙවි වරුන් මාර දිව්‍ය පුත්‍රයාට බියෙන් පළා ගියද ඔහුට බියෙන් පළා නොගොස් සිටි එකම දෙවියා වනුයේ දැඩිමුණ්ඩ දෙවියන්ය. මෙම ප්‍රවෘත්තිය මල් යහන් කවි වල දක්වා ඇත්තේ මෙසේය.

*"පිටදී බෝ කඳ ට*
*වැඩ ඉඳ විදුරසුන් පි ට*
*ආවත් මරුයුද ට*
*නොයම් බුදු වී මිසක් පිටත ට"*
*"බුදුන් තනි කර ලා*
*දෙවියෝ ගියා හැර ලා*
*දැඩියෙක් එපිට ලා*
*යුදකරමි සැලකලේ වැද ලා"* (ප්‍රනාන්දු, 1910, පි.2)

නම කී සැණින් යක්ෂයන් බිය වී පළා යන තරම් බලයක් මෙම දෙවියන් හට ඇතැයි ජනතා විශ්වාසයක් පවතී. මල් යහන් කවි සාහිත්‍යයේ ඒ පිළිබඳ මෙසේ එයි.

"දැකලා දෙවියන් යකු වෙව් ලන්නේ
රැකලා පිරිවර වේවැල ගන්නේ
වැඳලා සුරිඳුව බැහැ දකි මින්නේ
බිඳලා ගල අද දවමු කි යන්නේ " (ප්‍රනාන්දු, 1910, පි.3)

ඒ අනුව බෞද්ධ දෙවි කෙනෙකු ලෙස සැලකිය හැකි මෙම දේවතාවා යක්ෂ උවදුරු නැති කිරීමටත් තෙරුවන කෙරෙහි ශ්‍රද්ධාවෙන් සිටින තැනැත්තන් ආරක්ෂා කරන බවක්ද කියැවේ (ලංකාතිලක, 2002). සෝමකීර්ති (1996) පවසන ආකාරයට මෙම දෙවියන් යක්ෂයෙකැ'යි ජනතාව අතර පවතින මතය සාවද්‍යය. එහෙත් බණ්ඩාර (2005) දක්වන ආකාරයට මෙම දෙවියන්ට ගලේ යකා, වාහල යකා ආදී නාමයන්ද ව්‍යවහාර කිරීමෙන් ඉහත මතය අභියෝගයට ලක්වන බව පෙනේ. තවත් පුරාවෘතයකට අනුව දැඩිමුණ්ඩ දෙවියන් යක්ෂයන්ට අධිපති වෛශ්‍රවණ දෙවියන්ගේ සේනාපති වෙයි. ඇතැම් ප්‍රවාදයක එන පරිදි යක්ෂාධිපති මෙන්ම ධනාධිපති කුවේර හෙවත් වෛශ්‍රවණ විසින් සුදුමල් හෙවත් දැඩිමුණ්ඩට නිල් වේවැලක් හා රන් බොන්ඩියක් (කුන්තයක්) පිරිනමා යකුන්ගේ අධිකාරම් හෙවත් සෙනෙවිරත් තනතුරට පත් කළ බව පැවසේ (සිල්වා, 1994). තවද දැඩිමුණ්ඩ දෙවියන් වරෙක විෂ්ණු දෙවියන්ගේ අමාත්‍ය වරයා ලෙසද කටයුතු කර ඇති බවද පැවසේ (ධර්මදාස සහ තවත් අය, 1994). අනෝමදස්සී හිමි (1965) ද එම අදහස පිළිගනියි. උපුල්වන් දෙවියන්ගේ නමින් පවතින අලුත් නුවර දේවාලයට උපුල්වන් දෙවියන්ගේ රුවක් රැගෙන ආ පටන් දැඩිමුණ්ඩ දෙවියන් එම දේවාලයේ ආරක්ෂක දෙවියෙකු ලෙසට කටයුතු කර ඇති බවක් පැවසේ. ඇම්බැක්කේ ප්‍රධාන දේවාලයේ පූජාවට පාත්‍ර වන කතරගම දෙවියන්ගේද අධිකාරම් වරයා වශයෙන් සේවය කරන නිසා මෙම දෙවියන්ට වාහල දේවතා බණ්ඩාර යන නාමයද යොදනු ලැබේ (ඕවිටගෙදර, 2001). අනෝමදස්සී හිමි (1965) සඳහන් කරන ආකාරයට දැඩිමුණ්ඩ දෙවි ඉන්දියාවේ සිට මෙරටට වැඩි දෙවි කෙනෙක් වන අතර ශ්‍රී විෂ්ණු දෙවියන්ගෙන් වරම් ලබා දෙවුන්දර හා අලුත්නුවර ආදී පෙදෙස් වල බලපරාක්‍රමයන් දක්වා තිබේ. පහත පද්‍යයෙන් ඒ බව පැහැදිලි වේ.

"එකලා වෙණු දෙවිඳු අතින් අවසර ගන්නේ
සමන් දෙවිඳුගේ අවසර දෙවනු ල බන්නේ
කඳ කුමරිඳුගේ අවසර ලබා සො දින්නේ
දස අට දේසේ යක් සෙන් වැඳ වැඳ උන්නේ "

"නාරායණ සුවණ සුරිඳු දුනු ආයුද ගෙන
ගිගිරි බැන්ද රන් සෝලුව අතේ දරා ගෙන
මිහිරි එසපු මල් සුවඳත් දස දිග විදි මින
වඩිති දෙවුන්දර නුවරට සත රකිනා මෙන"

"දෙවනුව වැඩියේ උග්ගල් අළුත් නුවර වෙත
ගල් කරවා උක් හේනය සලකුණු පෙන් වත
මුණ්ඩ දැඩිය දෙවිඳු බෙලෙන් යකු දිව් දස අත
කන්දට වැඩිහිටි එම සඳ දිවැස් යොමා ගත "(ප්‍රනාන්දු, 1910, පි.8).

අලුත් නුවර දේවාලයේ දැඩිමුණ්ඩ දෙවි බලවත් වීමට විවිධ ආශ්චර්යවත් සිද්ධීන් හේතු වී ඇත. හතර කෝරළයේ සියලු පහසුකමින් යුතු දේවාලයක් ඉදිකළ පසු එයට පැමිණීමට ඇති මාර්ගයේ පැවති විශාල පර්වතයක් යකුන් යොදා දෙකඩ කළ බවක් ජනප්‍රවාදයේ එයි.

"දැකලා දෙවියන් යකු වෙව් ලන්නේ
රැකලා පිරිවර වේවැල ගන්නේ
වැඳලා සුරිඳුව බැහැ දකි මින්නේ
බිඳලා ගල අද දවමු කි යන්නේ "
"ගන්ඩ සුදුසුසේ සිසි ලැබ ගල්ලා
කොන්තකඩුත් යහුලුත් අර ගල්ලා
ගන්ඩ සුදුසු ආවුද අර ගල්ලා
තුන්ඩ වාසිකර ගල බිඳ පල්ලා "

"ගල්කුලු යකදා කෙටේරි ගන්නේ
තඩි පලි උදලුත් මුගුරුත් ගන්නේ
මහ වැ ගල් කුලු ගෙඩි අර ගන්නේ
මේ හැම ආවුද යකු තොපි ගන්නේ "

"අහසත් ගුගුරන සෙන හඬ විලසේ
පොළවත් මිහිකත කම්පා වන සේ
දෙරණත් එක ලෙස වෙඩි හඬ විලසේ
බිඳලත් ගල දැමූ පන්දු කෙ ලින සේ " (ප්‍රනාන්දු , 1910, පි.3)

දැඩිමුණ්ඩ දෙවි දුටු ගැමුණු රජු වෙනුවෙන් යුධ ජයග්‍රහණයේ යෙදීමත්, මහනුවරින් හා ඇම්බැක්ක ප්‍රදේශයෙන් පෘතුගීසින් පළවා හැරීමත්, අලුත් නුවර දේවාලය පෘතුගීසින්ගෙන් ආරක්ෂා කරගැනීම වැනි වීර ක්‍රියා සිදු කර ඇති බවද ජනප්‍රවාදයේ එයි (ඕවිටගෙදර, 2001).

"පරංගි රට අල්ලා සුනු මෙලයක් අලුත් නුවර වටලා ගත්තේ
බඳින්ඩ කියමින් වස්තුව ගන්නට දෙවියන්ටත් වින කර නිත්තේ
යකුන්ට අඬ ගහ එහු බඳවා රැබයෙන් එගොඩ පන්නා ගත්තේ
යකුන්ඩ රජකම් ගත්තා - වැන්නේ දේවතා බණ්ඩර මේ වැත්තේ " (ඕවිටගෙදර, 2001, පි. 65 ).

***දැඩිමුණ්ඩ දෙවියන්ගේ ස්වරූපය***



**ඡායාරූපය 1: දැඩිමුණ්ඩ දෙවියන්ගේ රූපකාය**
**මූලාශ්‍රය:** (*දිවයින, 2022. 01.23)*

වාහල බණ්ඩාර හෙවත් දැඩිමුණ්ඩ දෙවියන්ගේ ස්වරූපය විවිධ ආකාරයෙන් දක්වා ඇතත් වඩා ප්‍රචලිත ස්වරූපය වන්නේ උඩරට මුල් ඇඳුම වන තුප්පොට්ටිය, හැට්ටය හා තොප්පිය හැඳි ප්‍රභූවරයෙකුගේ ස්වරූපයකි. (ඡායාරූපය 1) සිල්වා (1994) සඳහන් කරන ආකාරයට දැඩිමුණ්ඩ දෙවි දකුණතින් බොණ්ඩිය දරාගත් සුදු සළු හැඳි අයෙක් ලෙස නිරූපණය කැරෙන අතර තවත් තැනක රන් දුන්නක් දකුණතින් දරා සිටින බවද පැවසේ. බණ්ඩාර (2005) සඳහන් කරන ආකාරයට මෙම දෙවියන්ගේ දේවාභරණය වනුයේ රන් බොන්ඩි වැලයි. සැවුළා මෙම දෙවියන්ගේ වාහන ලෙස සැලකෙන අතර විවිධ රූපයන්හි වාහල දෙවියන්ට පසෙකින් සැවුළු රූපයක් චිත්‍රණය කර ඇත. එසේම කුක්කුට ඡත්‍ර පති (බණ්ඩාර, 2005, පි.177). යන යෙදුමට අනුව මොහුගේ ධ්වජය වනුයේ කුක්කුට නොහොත් කුකුළාගේ රුව සහිත කොඩියයි. දැඩිමුණ්ඩ දෙවියන්ගේ රූප ගන්නෑ පත්තුවේ අංවාරම ලෙන් විහාරයේත්, මාවත පත්තුවේ කවුඩුගම ලෙන් විහාරයේ (අනෝමදස්සී හිමි, 1965) සේ ම ලංකාවේ විවිධ බෞද්ධ මෙන්ම දේව ආගමික සිද්ධස්ථානයන් හිද දැඩිමුණ්ඩ දෙවියන්ගේ රූප හා ප්‍රතිමා දක්නට ලැබේ.

සාධාරණ වූද යුක්ති ගරුක දෙවිකෙනෙකුන් ලෙසද ජනප්‍රියතාවක් දිනා ඇති දැඩිමුණ්ඩ දේවියන් යහපත් ආයාචනයක් කළ විට කිසිදා පිටුනොපාන බව බැතිමතුන්ගේ අදහසයි. අන්ධයන්ට පෙනීම ලබා දීම, ගොළුවන් කථා කිරීම, කොරුන් ඇවිද්දවීම, බරපතළ ආබාධ සුව කිරීම වැනි රෝග සුවකිරීම් මෙන්ම දේව භක්තියෙන් අදහන අයවළුන්ට දෙවියන් ආරූඪ කර වරම් ලබා දීමේ හැකියාවද දැඩිමුණ්ඩ දෙවියන් සතු වන බව අනාදිමත් කාලයක සිට පිළිගැනීමයි. සොරකම්, ස්ත්‍රී දූෂණ, කොල්ලකෑම්, විහාර දේවාල කොල්ලකෑම් හා ආගමට අපහාස කළවුන්ට මෙම දෙවියන් දැඩි දඬුවම් පමුණුවතැයි ජනතා විශ්වාසයක් ඇති අතර එම නිසා එවැනි හානියක දී දැඩිමුණ්ඩ දෙවි පිහිට පැතීමට ජනතාව නිතැතින්ම යොමුවෙති (සිල්වා, 1994). මේ අනුව දැඩිමුණ්ඩ දේව සංකල්පය දේශීය වශයෙන් ජනප්‍රියත්වයට පත් සුවිශේෂී දේව සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය.

**ගම්මඩු ශාන්තිකර්මයේ එන වාහල නර්තනය හා වාහල දේව ඇදහිල්ල**

දෙවොල් මඩු ශාන්තිකර්මයේ දැඩිමුණ්ඩ දෙවියන් වෙනුවෙන් සිදු කරනු ලබන ප්‍රධානතම පූජාව වනුයේ මෙම වාහල නර්තනයයි. මෙය අතිශය උද්වේගකාරී මෙන්ම ත්‍රාසජනක

නර්තනයකි. සාමාන්‍යයෙන් වාහල නටනු ලබන්නේ එක් ශිල්පියෙකු විසිනි. එහෙත් ඇතැම් තැනක දෙදෙනෙක් විසින් වාහල නර්තනය ඉදිරිපත් කරනුද දක්නට ලැබෙයි. (2018. 09. 16 දින කොරතොට පුරාණ දේවාලයේ පැවැත්වූ දෙවොල් මඩු ශාන්තිකර්මයේ නිරීක්ෂණ ඇසුරින්) ඇතැම් මූලාශ්‍රයවල වාහල නර්තනය පිළිබඳ සඳහන් නොවේ. ඒ වෙනුවට එම මූලාශ්‍රයයන්හි දෙවොල් නර්තනයද වාහල නැටුම ලෙස හඳුන්වා ඇත (Paul, 1954 ). ඔබේසේකර දක්වන පරිදි මාතර සම්ප්‍රදායේ දී වාහල නර්තනය රඟ දක්වනු නොලැබේ. (Obeysekere, 1984)

බස්නාහිර පළාතේ රබලිය ගුරුකුලයට අනුව වාහල නර්තනය රඟ දක්වනු ලබන්නේ දේවතා බණ්ඩාර හෙවත් දැඩිමුණ්ඩ දේවතාවා වෙනුවෙනි. සීනිගම හා සබරගමු සම්ප්‍රදායට අනුව වාහල දෙවි දෙවොල් දෙවියන්ගේ පිරිවරේ අයෙකැයි දක්වනු ලැබේ (Obeysekere, 1984). වාහල නර්තන ශිල්පියා වාහල නැටීමට පෙර අවම සතියක්වත් මාංශයෙන් තොර විය යුතු බව සම්මතයකි. සාමාන්‍යයෙන් වාහල නර්තනය සිදු කිරීම සඳහා අවසර ලැබෙන්නේ ගුරුකුලයක බොහෝ විට එක් අයෙකුට හෝ දෙදෙනෙකුටය. ඔවුන් ගුරුකුලයේ දක්ෂම ශිෂ්‍යයන් අතරින් තෝරා ගන්නා අතර ඒ සඳහා විශේෂ පුහුණුවක් ලබා දේ. වාහල නර්තනයේ යෙදෙන තැනැත්තා හෝ තැනැත්තන් හට තෙල්මේ නැටීම සඳහා අවකාශ හිමි නොවේ. එසේම වාහල නැටීමට පෙර ඔහු ඉතා හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය (මධුෂාන්, 2019).

***වාහල නර්තනයට භාවිත කරනු ලබන ඇඳුම් ආයිත්තම්***



**ඡායාරූපය 2: පත්තිනි තොරණ වෙත යාම**

**මූලාශ්‍රයః** 2017. 11. 04 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

වාහල නර්තනයේදී අදාළ ශිල්පියා විචිත්‍රවත් රතු සුදු සේලයකින්, හැට්ටයකින් හා උල් මුදුනක් සහිත තොප්පියක් පළඳියි. තොප්පියෙන් දෑස් වසා ගැනීමද සිදු කරයි. පාරම්පරික ශිල්පීන්ට අනුව එම හිස්වැසුමෙන් නිරූපණය වන්නේ දැඩිමුණ්ඩ දෙවියන්ගේ හිස්වැසුමයි. මෙම තොප්පිය විශේෂ අංගයක් වන අතර එවැනි හිස් පළඳනාවක් ශාන්ති කර්මයේ පළඳින එකම අවස්ථාව වාහල නර්තනයයි. (ඡායාරූපය 2) සමහර ප්‍රදේශවල (දිවුලපිටිය වැනි) හිස ආවරණය කිරීම සඳහා ලී වලින් සාදන ලද වෙස්මුහුණක් සහිත කේතු රූපාකාර හිස් වැසුමක් භාවිත කරයි. මීට අමතරව පහතරට ශාන්තිකර්මයන්හි අනිවාර්ය පැළඳුමක් වන ගිගිරි පැළඳීමද සිදු කරනු ලැබේ (මධුෂාන්, 2019).

***වාහල දේවාරූඪය හා නර්තනය***

දෙවොල් මඩු ශාන්ති කර්මයේදී වාහල දේවාරූඪයෙන් නැතහොත් ආවේශවීමකින් වාහල නැටුම නටන්නේ'ය යනුවෙන් ජනතාව අතර ප්‍රබල විශ්වාසයක් පවතී. (මධුෂාන්, 2019, රණසිංහ, 2019, සිල්වා 1994) එහෙත් වාහල නර්තනය පිළිබඳ නිරීක්ෂණ සටහන් කරන

ඔබේසේකර (1984) හෝ වෙනත් පර්යේෂකයෙකු හෝ ඒ පිළිබඳ කිසියම් හෝ අදහසක් ඉදිරිපත් කරන්නේ නැත.

නර්තන ශිල්පියා නර්තනය ආරම්භ කිරීමට මුල පුරන්නේ 'කාල පන්දම් ගස' නැමැති ස්ථානය අසල සිටය. ඇතැම් අය මෙයට කප් ගස, කප නැමැති නම්ද ව්‍යවහාර කරති. (ඡායාරූපය 3, 4)




**ඡායාරූපය 3: 4: කාල පන්දම් ගස**

**මූලාශ්‍රය:** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

2022. 02. 30 දෙල්ගොඩ පනන්වල පුරාණ කතරගම දේවාලයේ පැවැත්වූ දෙවොල් මඩුව ශාන්තිකර්මය

වාහල දෙවියන්ගේ ආකර්ෂණය ලැබෙන මන්ත්‍ර 21 වර සාම්බ්‍රාණි සුවඳ දුම් වලට මතුරා නර්තන ශිල්පියා කාල පන්දම් ස්ථානයේ හිඳුවා ඔහුගේ සර්වාංගයටම අල්ලනු ලැබේ. ඒ අතරතුර වාහල දෙවියන්ගේ කවි හා උපත් ගී ගායනා කරනු ලබයි.

"පවන් සිසිල සොමි ගුණෙහි ලතා වේ
රුවන් වැලක මිණි ඇමිණු ලතා වේ
රුවන් ඇලෙන් වැසි මල් වරුසා වේ
කියන් උපත වාසල පුවතා වේ"

"තොසේ මව් ලැබ යස සේ වැඩ උ න්නා
බැස මිනි කලඹක් සේම දිලෙ න්නා
දස මස් පසු වී ලකුණු පෙනෙ න්නා
අස්විය ඇති දැඩිමුරු කුමරු උප න්නා "

"කපට පළමු පුල්වන් අවතාරේ
සතට අභය දෙන නාරායන අවතාරේ
ලකට පසිඳු දස වෙස් අවතාරේ
යකුට කියන් පරසිඳු දැඩිමුළු අවතාරේ " (මධුෂාන්, 2019)

උක්ත නිදර්ශන වලට අනුව අදාළ කවි ගායනාවන්ගෙන් වාහල දෙවියන්ගේ තේජස, ස්වාභාවය හා බලය විදහාපාන බව පෙනේ. වාහල දේවාරූඪය ලබා ගැනීමට මතුරනු ලබන මන්ත්‍ර දිෂ්ටි මන්ත්‍ර ලෙස හඳුන්වා දෙනු ලැබේ. සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවන්ගෙන් අනාවරණය වූයේ සෑම ආරූඪයක් සඳහා ඒ ඒ ගුරුකුල වලට අනන්‍ය දිෂ්ටි මන්ත්‍ර පවතින බවයි. එකී ගුරුකුලවල අනන්‍යතාව රැකීමට හා ඒවායින් විපත් සිදු කළ හැකිය යනුවෙන් සම්ප්‍රදායිකව මතවාදයක් ගොඩ නැගී ඇති අතර සිය පරපුරෙ පිට සම්පූර්ණ මන්ත්‍ර ලබා දීමට

එම ඇදුරෝ මැළි වෙති. මෙහි භාෂාව බොහෝ විට සංස්කෘත මිශ්‍ර සිංහලයට නැකම් කියයි. මේ එවැනි එක් දිෂ්ටි මන්ත්‍රයකිඃ



**ඡායාරූපය 5ඃ පොල් මල් පේ කිරීම**

**මූලාශ්‍රයඃ** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

> "ඕං ගුරු වරං ගුරු පත්‍ර කාලි වරං, සුර වරං සුර පත්‍ර කාලී වරං අසුර වරං අසුර පත්‍ර කාලී වරං දේව වරම් දේව පත්‍ර කාලි වරං නාග වරං නාග පත්‍ර කාලි වරං කීලාසන වරං කීලාසයේ ගුරු ධරණේ වරං යන්ත්‍ර වරං යන්ත්‍ර මන්ත්‍ර වරං තන්ත්‍ර වරං ශ්‍රී විෂ්ණු නාරායණේ වරං ...." (මධුෂාන්, 2019)

මේ මන්ත්‍රය සමඟ තව දිෂ්ටි මන්ත්‍රද භාවිත වේ. බොහොමයක් මෙම මන්ත්‍ර අනුප්‍රාස බහුල වේග රිද්ම ගද්‍ය පාඨ වෙයි. මෙම මන්ත්‍ර පළපුරුදු ඇදුරෙකු විසින් මතුරමින් වාහල ශිල්පියාගේ ශරීරයට දුම අල්ලනු ලබන අතර භේරී වාදකයෝ දැඩිමුණ්ඩ මල්යහන් කවි ගයමින් වේගවත් බෙර පද වාදනය කරති. මොහොතකින් නර්තන ශිල්පියා ආරූඪයට පත්ව හිඳි අසුනින් නැඟී ඉදිරියට පනී. (2017.11.04, 2018.09.16, 2022.02.30, 2023.01.08 කොරතොට, පනන්වල, අහුගම්මන පැවැත්වුණු දෙවොල් මඩු නිරීක්ෂණ ඇසුරෙන්)

### *නර්තනයේ ආරම්භය*

වාහල යාදිනි කවි ගයා දුම්මල ඇල්ලීමෙන් පසුව ශිල්පියා දේවාරූඪය ලබයි. එහිදී වේගවත් බෙර වාදනයක් ඉදිරිපත් කරන අතර ශිල්පියා වේගයෙන් ගැහීමට ලක් වේ. කොට්ටෝරුවන් නමින් හැඳින්වෙන අත් උදව් කරුවෝ එහිදී ශිල්පියා වේගයෙන් අල්ලා ගෙන සිටින අතර සුදුසු අවස්ථාව එළඹි කල්හි ශිල්පියා මඩුභූමිය දෙසට තල්ලු කරනු ලැබේ. එහිදී ශිල්පියා වට කීපයක් වේගයෙන් කැරකෙමින් ඉදිරියට යන අතර එය පහතරට නර්තනයේ මාලක්කන් රැල්ල නමින් හඳුන්වයි. පළමුවෙන්ම ප්‍රධාන තොරණ අසලට යන ශිල්පියා ඉන්පසු පිළිවෙලින් සිව් වරම් දෙවිවරු ප්‍රධානව අනෙකුත් මල් යහන් වෙතද යනු ලැබේ. අනතුරුව අගුරු කබල ශිල්පියාගේ අතට දෙනු ලබන අතර සෑම යහනකටම දුම්මල දුම අල්ලනු ලැබේ. (ඡායාරූපය 6)



**ඡායාරූපය 6: හත් පදයේ දුම් ඇල්ලීම,**

**මූලාශ්‍රය:** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

ඒ අතරතුරේද කෙටියෙන් නර්තන ඉදිරිපත් කිරීම් සිදුවෙයි. දුම් ඇල්ලීමෙන් අනතුරුව කාල පන්දම් ගස ලගට පැමිණෙන ශිල්පියා පූජා ද්‍රව්‍ය තබා ඇති මල් යහන තදින් අල්ලාගෙන සිටියි. එවිට සහයකයෝ ඔහුගේ අතට කහ දියර ඇති මැටි කොතලයක් ලබා දෙන අතර ශිල්පියා මුළු මඩු භූමියේම කහ දියර ඉසිමින් වේගයෙන් ගමන් කරයි. මීළඟට මැටියෙන් කරන ලද කුඩා මුට්ටියක් ගෙන නර්තනය ඉදිරිපත් කරනු ලැබේ. නර්තනය අවසානයේ කලස කාල පන්දම් ගසේ ගසා කුඩු කරයි. ඇතැම් ශාන්තිකර්ම වල කළස් එකකට වැඩි ප්‍රමාණයක් භාවිත කරන අතර වාහල නර්තන ශිල්පියා බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා තවත් මුට්ටි සූදානම් කරගෙන සිටියි. ඇතැම් ශිල්පීන් කාල පන්දමේ ගැසීම වෙනුවට සිය මුහුණට ගසා කුඩු කිරීමද සිදු කරති. එයින් පසු ශිල්පියා මඳ වේලාවක් කාල පන්දම් ගසේ රැඳී සිටියි. (ඡායාරූපය 7)



**ඡායාරූපය 7: වාහල ශිල්පියා කාල පන්දම් ගසේ රැඳී සිටීම**

**මූලාශ්‍රය:** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

ගම්පහ, නිට්ටඹුව, දෙල්ගොඩ වැනි ප්‍රදේශ වල ඇතැම් ශිල්පීන්ගේ මතය වනුයේ මුගුර නමින් හැඳින්වෙන වේවැලක් ගෙන මීළඟට නර්තනයේ යෙදෙන බවයි. එම ශිල්පීනට අනුව වේවැලෙන් නිරූපණය වන්නේ දැඩිමුණ්ඩ දෙවියන් අත ඇති සැරයටිය බවයි. එහෙත් කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ රඟ දක්වනු ලැබූ මඩු ශාන්තිකර්මයන් හි මෙම වේවැල දක්නට නොලැබේ. මීළඟට සෝලු ලීය නමින් හැඳින්වෙන ලීයෙන් සැදූ උපකරණයක් ගෙන නර්තනය යෙදේ. 'සෝලුව' යන්නට ලබා දෙන කෝෂාර්ථය වනුයේ 'සැරයටිය, මලින් කළ සැරසිල්ල, නළල් පට' යන ඒවාය(සිංහල අක්ෂර වින්‍යාස ශබ්ද කෝෂය, 2020, පි. 326).

එයද තැන්පත් කර තිබෙන්නේ අනෙකුත් පූජා භාණ්ඩ තැන්පත් කර ඇති යහනේය. එයද දෙවියන්ගේ ආභරණයක් ලෙස සැලකේ (මධුෂාන්, 2019). එහෙත් ඇතැම් අය මෙම ලී උපකරණයටද මුගුර යන නාමය ව්‍යවහාර කරති. එම නර්තනයෙන් අනතුරුව පොල් මල් ගෙන නර්තනයේ යෙදීම ආරම්භ කරයි. (ඡායාරූපය 5) පොල් මල් ගෙන නටමින් සිය මුහුණට තලා ගැනීම සිදුවෙයි. මෙය තරමක් ත්‍රාසජනක හා භයානක රංගනයක් වන අතර පොල් මල් සතක් - දහහතරක් වැනි ප්‍රමාණයක් තලා ගැනීම සිදු වෙයි. මෙයින් අපේක්ෂා කරනුයේද වස් දොස් දුරු කිරීම වෙයි. ඇතැම් ශිල්පීන්ගේ මතය අනුව පොල් මල් වැඩි ප්‍රමාණයක් තලා ගැනීමට සිදු වන්නේ අදාළ භූමියේ දෝෂ වැඩි වන කල්හිය (රණසිංහ, 2019.03.20). පොල් මල් තලා ගැනීමෙන් පසු හක් ගෙඩිය ගනු ලබන අතර එය පිඹිමින් හා නර්තනයේ යෙදීමෙන් පසු උදාවන්නේ පන්දම් පාලියයි. මෙය ඉතා ත්‍රාසජනක ලෙස රඟ දක්වන අතර පත්තිනි තොරණ ඇතුළුව සෑම මල් යහනකටම දුම්මල කීරි ගැසීම සිදු වෙයි. දුම්මල ගැසීමට පෙර පන්දම ගෙන පද කිහිපයක් නැටීම ද සිදුවන අතර මඩු භූමිය අවටත් දේවලයක නම් සියලු දේව මන්දිර වලටත් දුම්මල ගසමින් වේගයෙන් දිව යනු ලැබේ (ඡායාරූපය 8:9).



**ඡායාරූප 8:9: ගිනි පන්දම් ගෙන රංගනයේ යෙදීම**

**මූලාශ්‍රය:** 2023. 01. 08 දින දෙල්ගොඩ අහුගම්මනදී පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

ප්‍රේක්ෂකයන් අතර භයානක රසය මතු කිරීමට මේ අවස්ථාව සමත් වන අතර කොට්ටෝරුවෝ ශිල්පියා පාලනයට උත්සාහ ගැනීමට ගන්නා මෙහෙය ඇතැම් විට ප්‍රේක්ෂකයන්ගේ උපහාසයටද ලක් වෙයි. මඩු භූමියෙන් පිටතට ගිය ඇදුරා නැවත ගෙන්වා ගැනීම සඳහා බෙර වාදකයන් නොනවත්වා වේගයෙන් බෙර වාදනය කරන අතර එලෙස නොපැමිණියහොත් තෙවරක් සක් පිඹීමෙන් සංඥා කොට ඔහු ගෙන්වා ගනු ලැබේ. එසේම එම අවස්ථාවේ දී වාදනය කරන බෙර පද පෙර වැයූ ඒවාට වඩා වෙනස් ස්වරූපයකින් යුතු වේ. අවසානයේ වාහල නටන ලද ශිල්පියා හෝ දෙපළ වාහල යහන ලඟ සිහිමුර්ජා වී වැටෙන අතර අනෙකුත් ශිල්පීන් විසි ඔහු පැදුරක හොවනු ලබන අතර දැහැන් මන්ත්‍ර නමින් හඳුන්වන මන්ත්‍ර 7 ක් කියා කහ වතුර ඉස පියවි සිහිය ගනු ලැබේ. (2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය, 2023. 01. 8 දින දෙල්ගොඩ අහුගම්මනදී පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය)



**ඡායාරූපය 10: ප්‍රේක්ෂකයන්ගෙන් පඬුරු ලබා ගැනීම**

**මූලාශ්‍රය: මූලාශ්‍රය:** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

මේ එවැනි එක් දැහැන් මන්ත්‍රයකි.

*"ඕං ශ්‍රීං වඩිග නීල කුරුම්බර දිෂ්ටි හැර තොපගේ විමන් බලා ඉගිල ඉගිල ඉර්දි නීල වඩිච්චියෙන් යංය :"*

සිහිය ලැබීමෙන් පසු ශිල්පියා විසින් සෙත් කවි කියා ආශිර්වාද කරනු ලැබේ. ඉන් වාහල නර්තනය අවසන් වේ. අවසානයේ භාගයේ දී දැඩිමුණ්ඩ සව්දම් ගයා වාහල පිදේනි පිදීමෙන් අනතුරුව වාහල නර්තනය අවසාන වෙයි. අවසානයේ ප්‍රේක්ෂකයන් විසින් පඬුරු ලබා දීමද සිදු කරනු ලැබේ. (ඡායාරූපය 10)

***වාහල බෙර පද***

වාහල නර්තනය ඇතුළු සමස්ත මඩු පූජෝත්සවය සඳහා ප්‍රධාන අවනද්ධ භාණ්ඩය ලෙස යොදා ගැනෙන්නේ දෙවොල් බෙරයයි. එසේම අනෙකුත් නර්තන විශේෂාංගයන්ටත් වඩා වාහල නර්තනයේදී භේරී වාදනය සඳහා විශේෂ අවධානයක් දෙනු ලැබේ. සිදු කරන ලද නිරීක්ෂණ අනුව භේරී වාදන ශිල්පීන් බොහොමයක් මෙම අවස්ථාවේදී සිය දායකත්වය ලබා දීමෙන් තහවුරු වන්නේද එම කාරණයයි. එසේම කිසිදු ආකාරයක නැවැත්වීමකින් තොරව සමස්ත වාහල නර්තනය පුරා බෙර වාදනය අඛණ්ඩව පවත්වාගෙන යන අතර වයන බෙර පදයන්ගෙන් ආරූඪ වූ වාහල නර්තන ශිල්පියා පාලනය කළ හැකි බවට ඔවුන් අතර දැඩි විශ්වාසයක්ද පවතී. (මධුෂාන්, 2019: රණසිංහ, 2019) ඒ අනුව විවිධ රිද්මීය ලක්ෂණයන්ගෙන් යුක්ත බෙර පද වාහල නර්තනයේදී යොදා ගැනීම සිදු වේ. පහතින් දැක්වෙන්නේ එම බෙර පද කීපයකට නිදසුන් කීපයකි.

***බෙර පද***

- යහන් දැක්මට පද

"ගුද් ගුඳ ගත ගත් ගත ගත.
දොන් රෙග දෙගත් රෙගත ගත් දෙගත ගත් දොංත ගත ගදිත ගුං //
දොං රෙගත ගත් දෙගත ගත් දොංත ගත
ගදිත ගත දිකුඳ ගත ගදිත ගත දොංත ගත් දිකුඳ ගත්
දොංත ගත ගත්ත ගුංදං ගතං , ගත් තරිකිට ගුං තරිකිට
ගතත් දෙං රුඳත් ගත්ත ගුඳත් දෙහිං ගතත් ගත්ත ගතත් දෙහිං
රුඳත් දෙහිං ගුඳත් දෙහිං ගුඳ ගුදිත ගත් තම් ගතං දෙහිං //
රෙම් දෙහිං රුඳ ගුඳ ගත්ත ගුන්ද ගත් දිත් තත් ගුහිති ගත්
දිරිකිට ගුඳගත් දෙහිං / ගුද් ගුඳ ගුඳ ගත් ගත ගත "

මේවා සම්පූර්ණ කොටස් 3 ක් වාදනය කරනු ලැබේ.

- කහ දියර හා අඟුරු දුම් ඇල්ලීම සඳහා පද

"දොං ගුදිගුං ගතං ගතං - ගදිගත ගුඳ ගතං ගතං "

- පොල් මල් පදය සඳහා බෙර පද

"දුං ගුදි ගුං දෙකත ගතත් "

- මුගුර සඳහා බෙර පද

"රුඳ ගුඳ ගුඳ ගුදිත - ගත ගත ගත ගුදිත ගදිත " (මධුෂාන්, 2019)

මේ ආකාරයට සෑම අවස්ථාවක් සඳහා ම එකිනෙකට වෙනත් රිද්මීය ලක්ෂණයන්ගෙන් යුතු බෙර පද වාදනය කරනු ලැබේ.

**වෙනත් නිරීක්ෂණ: වාහල නර්තනය පිළිබඳ පොදු සමාජ- සංස්කෘතික අදහස්**

මත්පැන් පානය කිරීම, වැඩිවියට පත් වීම, නුසුදුසු මාංශ අනුභවය වැනි පොදු සමාජයේ කිළි ලෙස සැලකෙන දෑ සිදු කර වාහල නැටුම් පැවැත්වෙන අවස්ථාවට පැමිණියහොත් වාහල දෙවි වරම් ලද ශිල්පියාගෙන් පන්දම් පහර හෝ පොල් මල් පහර දඬුවම් ලෙස ලැබෙන බව ජනතාව පිළිගනිති. ඒ අනුව එවැනි අයහපත් ලෙස නොසැලකෙන කිසිවක් නොකිරීමට ප්‍රේක්ෂකයෝ වග බලා ගනිති. සුදුසුකම් සපුරා නොමැති නම් පූජා බිමට ඇතුළු වීමෙන් වැළකී සිටිති. මෙය තවත් ලෙසකින් ගතහොත් ඒකරාශී වූ ජන සමූහයක ආරක්ෂාව සඳහාද හේතු වේ. (2017.11.04, 2018.09.16, 2022.02.30, 2023.01.08 කොරතොට, පනන්වල හා අහුගම්මන පැවැත්වුණු දෙවොල් මඩු නිරීක්ෂණ ඇසුරෙන්)

අනෙකුත් නර්තනාංගයන්ට සාපේක්ෂ ව මෙම නර්තනාංගයේ විශේෂතා දක්නට ලැබේ. පළමුවැන්න නම් ගම්මඩු ශාන්තිකර්මයේ එන සෙසු නර්තනයන්ට සාපේක්ෂව මෙම නර්තනය අතිශය උද්වේගකාරී ස්වාභාවයෙන් යුතුය. පූජෝත්සවය නරඹන්නට පැමිණෙන්නෝ සෙසු නර්තනාංගයන්ට වඩා මෙම නර්තනය කෙරෙහි විශේෂ අවධානයක් දක්වති. තෙල්මේ ආදී නර්තාංගයක වුව උද්වේගකාරී ස්වාභාවයක් දක්නට ලැබුණද එහිදී ප්‍රේක්ෂකයන් දක්වන ප්‍රතිචාරයට වඩා වෙනස් ප්‍රතිචාරයක් මෙම නර්තනාංගය වෙත දක්වන බව පැහැදිලි වේ. (ඡායාරූපය 11) වෙනත් නර්තනාංගයකදී ප්‍රේක්ෂකයන් නගන ඔල්වරසන් හඬ වෙනුවට කිසියම් භය පක්ෂපාතීකමක් මෙහිදී දක්වනු ලබන බවද හඳුනාගත හැකිය. මේ සඳහා හේතුකාරකය වන්නේ මෙම නර්තනය දැඩිමුණ්ඩ දෙවි විෂයයෙහි පූජාවක් ලෙස ඉදිරිපත් කැරෙන නිසාය.



**ඡායාරූපය 11: වාහල නැටුම නරඹන ප්‍රේක්ෂක බැතිමතුන්**

**මූලාශ්‍රය:** 2018. 09. 18 දින කොරතොට පුරාණ පත්තිනි දේවාලයේ පැවැත්වූ ගම්මඩු ශාන්තිකර්මය

**නිගමන හා සමාලෝචනය**

සමස්තයක් වශයෙන් බලන කළ ගම්මඩු ශාන්ති කර්මයේ එන වාහල නර්තනය දැඩිමුණ්ඩ දෙවියන්ගෙන් ආතුරයාට සෙත ශාන්තිය ලබාගැනීම උදෙසා අරමුණු කරගත් නර්තනාංගයක් වේ. Rasnayake සහ තවත් අයට (2013) ට අනුව ශාන්තිකර්ම පැවැත්වීම හා දෙවියන් පිදීම සිදු කිරීම සම්බන්ධ වන විවිධ කාරණා ඇත. මානසික සුව සහනය සලසා ගැනීම, සමාජ හා සදාචාරාත්මක අධ්‍යාපනය, සමාජයේ පවත්නා පිළිගත් පුරාවෘත හා චරිත ඇගයීමත් ඒවාට සුදුසු ගෞරවය ලබා දීමත් යාතුකර්ම පැවැත්වීමේ මූලික අරමුණු වෙයි.

ඒ අනුව වාහල නර්තනයේ පවත්නා ආවේණික ශ්‍රව්‍ය දෘශ්‍ය ස්වාභාවයෙන් දැඩිමුණ්ඩ දේව සංකල්පය උත්කර්ෂයට නංවන බව හඳුනාගත හැකිය. වාහල නර්තන ශිල්පියා සැරසෙන රතු හා සුදු වර්ණයෙන් යුතු ඇඳුම් ආයිත්තම් වලින් මතු කැරෙන සන්නිවේදනාර්ථය වාහල දෙවි යනුවෙන් ජනතාව අතර මුල්බැස ගෙන ඇති යක්ෂ සම්භවයකින් යුතු දේවතා සංකල්පය උත්කර්ෂයට නංවයි. වේගවත් මෙන්ම උස් හඬින් ගැයෙන ගායනාවන්ගේ සාහිත්‍යමය මෙන්ම නාදාත්මක අන්තර්ගතය වාහල දේව සංකල්පය ඉස්මතු කිරීමට සමත් වෙයි. භේරී වාදනයෙන් හා සමස්ත වටාපිටාවෙන්ද එම කරුණ වඩාත් තහවුරු කරයි.

පෙර සාකච්ඡාවෙහි මතු කරන ලද ආකාරයට දැඩිමුණ්ඩ දෙවි 'යක්ෂ' නමින් හැඳින්වෙන පිරිස නියෝජනය කරන දෙවි කෙනෙකි. එසේම පුරාණෝක්තිවල දැක්වෙන ආකාරයට බුදුන් වහන්සේ මාර පරාජය කරන අවස්ථාවේ උන්වහන්සේ තනි නොකළ එකම දෙවියා ය; යකුන්ගෙන් වැඩ ගත් දෙවියා ය; අලුත් නුවර මහ ගලක් යකුන් යොදවා බිඳිනු ලැබූ තැනැත්තාය. මේ ආකාරයේ පුරාණෝක්ති හා ප්‍රවාද ජන සන්තානගතව ඇත. මේ නිසා දැඩිමුණ්ඩ දෙවි කෙරෙහි ජනතාව විශේෂ භය පක්ෂපාත බවක් දක්වන බව පෙනේ. වාහල නර්තනයේ දී දැඩිමුණ්ඩ වරම් ලබන නර්තන ශිල්පියා සිදු කරන මැටි කොතල මුහුණට ගසා ගැනීම , පොල් මල් තලා ගැනීම , පන්දම් රැගෙන සිදු කරන නර්තනය හා මඩු බිම අවට දිව යමින් දුම්මල කීරි ගැසීම ආදී ත්‍රාසජනක ක්‍රියාකාරකම් වාහල හෙවත් දැඩිමුණ්ඩ දේවතා සංකල්පය උත්කර්ෂයට නැංවීමට හේතු වී ඇත. සමස්ත නර්තනාංගය පුරා දක්නට ලැබෙන ජවසම්පන්න හා අද්භූත ස්වාභාවය දැඩිමුණ්ඩ දෙවියන්ගේ බලය අන්‍ය ආකාරයකින් ප්‍රකට කිරීමට උත්සාහ ගැනීමක් ලෙස හඳුනා ගත හැකි වේ. රැය පහන් වන තුරු විවිධ නර්තන හා පූජා විධි දැක්මෙන් හා නිදි වැරීමෙන් වෙහෙසට පත්ව සිටින ප්‍රේක්ෂකයාගේ අවධානය පූජාකර්මය අවසාන වනතෙක් යාගය කෙරෙහි තබා ගැන්මට මෙහි ඇති උද්වේගකාරී බව මෙන්ම ත්‍රාස ජනක බවද හේතු වී ඇති බව පෙනේ. බෞද්ධාගමික පසුබිමක් තුළ රෝපණය වූ දැඩිමුණ්ඩ දෙවියන් පිළිබඳ සංකල්පය ලාංකේය ජනතාවගේ ආගමික සංස්කෘතිය නිරූපණය කරන මූලිකාංගයක් ලෙසද වාහල නර්තනය එම දේව සංකල්පය ජනතාව අතර ව්‍යාප්ත කිරීමෙහිලා උපස්ථම්භනයක් වී ඇති බවද මේ අනුව තහවුරු වේ. එසේම සංස්කෘතික උරුමයක් වශයෙන් මෙහි මහඟු වටිනාකමක් ඇති බවද හඳුනාගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අනෝමදස්සී හිමි, ඒ. (1965). *අලුත්නුවර විස්තරය හා වට්ටාරම් විස්තරය.* කර්තෘ ප්‍රකාශන

ආනන්ද, ඩී. ටී. එච්. (2019). *මානව වංශ විස්තරකථන අධ්‍යයන*: මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පර්යේෂණ වාක්කෝෂය, සංඝසුමන හිමි පී., විජිතධම්ම හිමි එම්. (සංස්.), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ඕවිටගෙදර එස්. (2001). *අලුත් නුවර දේවාලය හා වත් පිළිවෙත් විමර්ශනය.* කර්තෘ ප්‍රකාශන

කාරියවසම්, ටී. (1976). *ශාන්තිකර්ම හා සිංහල සමාජය.* ප්‍රදීප ප්‍රකාශන

කාරියවසම්, ටී. (1990). *ගම්මඩු පුරාණය.* කර්තෘ ප්‍රකාශන

කාරියවසම්, ටී. (1991). *සිරිලක දෙවිවරු.* ගොඩගේ

කෝට්ටෙගොඩ, ජේ. (1995). *පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය.* කර්තෘ ප්‍රකාශන

චාමර, එච්. එන්. සහ තවත් අය (2017). සියනෑ කෝරළයේ ප්‍රාදේශීය දේව ඇදහිලි හා බැඳි ජන ජීවිතය: විචක්ෂණ: ශාස්ත්‍රීය පර්යේෂණ සංග්‍රහය.

රත්නායක පී., අමරසිංහ ජේ., දිසානායක ඩබ්. කේ. (සංස්.). අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය

ධර්මදාස, කේ. එන්. ඕ., තුණ්දෙනිය, එච්. එම්. එස්, (1994). *සිංහල දේව පුරාණය.* රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පැස්කුවල්, එම්. කේ. (2017). *සබරගමු ගැමි නාටකයඃ එහි ස්වාභාවය හා සන්නිවේදනාර්ථ.* ගොඩගේ

ප්‍රනාන්දු, ඇම්. ජේ. (1910). *මල් යහන් කවි සහ කන්නලවි.* පී.ඒ.ඩී. රොමානිස් අප්පුහාමි ප්‍රකාශන

මධුෂාන්, ටී. (2019.03.20). *ගම්මඩු ශාන්තිකර්මය හා වාහල නර්තනය*, (සම්මුඛ සාකච්ඡාව කළේ) සුභාෂ් ජී. කේ. අකුරුමුල්ල (වයස 40)

බණ්ඩාර, ඩී. කේ. ඩී. (2005). *ඉපැරණි සිංහලේ ලාංකේය දෙවි දේවතාවෝ.* ප්‍රථම මුද්‍රණය. රත්න ප්‍රකාශන

රණසිංහ, එච්. (2019.03.20). *ගම්මඩු ශාන්තිකර්මය හා වාහල නර්තනය*, (සම්මුඛ සාකච්ඡාව කළේ) සුභාෂ් ජී. කේ, අකුරුමුල්ල (වයස 65)

ලංකාතිලක, ඩී. (2002). *සබරගමු ශාන්තිකර්ම විග්‍රහය.* කර්තෘ ප්‍රකාශන

සරච්චන්ද්‍ර, ඊ. (2012). *සිංහල ගැමි නාටකය.* ගොඩගේ

සිංහල අක්ෂර වින්‍යාස ශබ්ද කෝෂය. (2020). *සෝලුව.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

සිල්වා, සී. ඇම්. ඕ. (1994). *අලුත් නුවර පුරාණ මහා දේවාලය* (ස්පෝලියා සෙලනිකා) සිරිනිමල් ලක්දුසිංහ (සංස්.), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

සෝමකීර්ති, පී. (1996). *ආරාධනා සහිත දේව ශාන්තිය.* මාඩන් පොත් ප්‍රකාශකයෝ

සුමනපාල, එස්. කේ. (1995). *තොවිල්.* ඇම්. ඩී. ගුණසේන

Callaway, J. (1991). *Yakkun natanava and Kolan natanava*. Kariyawasam, T. (ed.). Godage

Wirz, P. (1954). *Exoricism and theart of healing in Ceylon*. Leiden publications

Obeysekara, A. G. (1984). *The Cult of Godess Pattini*. University of Chicago Press

Rasnayake, S. et al. (2013). *Diffusion of Religious Values and Repositioning the God Sakra in Sinhalese Religious Pantheon: The Case of New Lakshmi Shrine in Katharagama. (*Modern Sri Lanka Studies)

දිවයින, (2022. 01.23), *දැඩිමුණ්ඩ දෙවායෝ* (ඡායාරූප). https://divaina.lk (retrived 2022.07.21)

**ක්ෂේත්‍ර අධ්‍යයන**

2017. 11. 04 දින කොරතොට පුරාණ දේවාලයේ පැවැත් වූ දෙවොල් මඩුව ශාන්තිකර්මය

2018. 09. 16 දින කොරතොට පුරාණ දේවාලයේ පැවැත් වූ දෙවොල් මඩුව ශාන්තිකර්මය

2022. 02. 30 දෙල්ගොඩ පනන්වල පුරාණ කතරගම දේවාලයේ පැවැත්වූ දෙවොල් මඩුව ශාන්තිකර්මය

2023. 01. 08 දින දෙල්ගොඩ අහුගම්මනදී පැවැත්වූ දෙවොල් මඩුව ශාන්තිකර්මය